# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය

## පුරප්පාඩු

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා අවශ්‍ය කෙරෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

***නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව)***

***සුදුසුකම්***

**බාහිර :**

**වෘත්තිය සුදුසුකම් :** පළමුවැනි හෝ දෙවන ඉහළ පෙළ සිව් වාර්ෂික විද්‍යාවේදී හෝ කෘෂිකර්ම උපාධිය සමඟ අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය

**පළපුරුද්ද :**

අ) ආචාර්ය උපාධිය ලබාගැනීමෙන් අනතුරුව වසර අටක් (08) හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර දෙකක් (02) ඇතුළත්ව අවම වශයෙන් වසර දාසයක (16) පර්යේෂණ කටයුතු පිළිබඳ කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්ද සමඟ යහපත් සේවා වාර්තාවක් තිබිම.

සහ

ආ) විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ විද්‍යාඥයින් හට නායකත්වය සහ මඟ පෙන්වීමේ හැකියාව සතුවිය යුතු වේ. මානව සම්පත් සහ අනෙකුත් සම්පත් මනා ලෙස යෙදවිම හා කළමනාකරණ කාර්යක්ෂමතාව අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස, වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණ :**

අවුරුදු 35 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 50 ට වඩා වැඩි නොවිය යුතුය. මෙම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.
HM 1-3 (රු.86,865 – 2270 x 15 – රු.120,915.00)
ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා වෘත්තිය දීමනාව ද ගෙවනු ලැබේ.

**සටහන :** එමෙන්ම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2015, 01/2015 සහ 01/2015 (i) අනුව සන්නිවේදන දීමනා, ඉන්ධන දීමනාව සහ ප්‍රවාහන දීමනාව හෝ නිල වාහනය වෙනුවෙන්ද සුදුසුකම් ලබයි.

**රැකියා විස්තරය :** රබර් වගාව සහ රබර් සැකසුම් පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

**තේරීමේ ක්‍රමය :** පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**සියළු තනතුරු සඳහා වෙනත් වරප්‍රසාද සහ පොදු කොන්දේසි**

- ♦ ආයතනයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ පවතින නීති රීති ප්‍රකාර වෛද්‍ය ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.
- ♦ සේවකයා විසින් වැටුපෙන් 10% ක් කාර්යය මණ්ඩල අර්ථ සාධක අරමුදල සඳහා දායක කළ යුතු අතර, ආයතනය විසින් 15% ක දායකත්වයක් සපයනු ලැබේ. සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල වෙනුවෙන් ආයතනය විසින් 3% ක දායකත්වයක් සපයනු ලැබේ.
- ♦ අගලවත්ත කාර්යාලයේ සේවය සඳහා තේරී පත්වන අය සඳහා (ආයතනයේ නීති රීති ප්‍රකාරව හිස්ව තිබේ නම්, කුලී රහිත, ගෘහ භාන්ඩ සහිත නිල නිවාසයක් ලබාගැනීමට හෝ රත්මලාන සිට අගලවත්ත දක්වා ධාවනය කෙරෙන කාර්යාල බස් රථයෙන් (ආයතන) නීති රීති ප්‍රකාරව දිනපතා ගමන් කිරීමේ පහසුකම් ලබා ගත හැක.
- ♦ ශ්‍රී ලංකාවේ ඕනෑම පලාතකට මාරු කළ හැක.

**අයදුම්පත් ක්‍රියාවලිය**

පහත දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව සකසන ලද අයදුම්පත් **2024.08.12 වැනි දිනට හෝ ඊට පෙර <u>ලැබෙන සේ</u>** ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය. ලිපි කවරයේ ඉහල වම් කෙළවරෙහි තනතුර සඳහන් කළ යුතු වන අතර, දැනට රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/පුද්ගලික ආයතන වල සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත අදාල ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුය.

1. සම්පූර්ණ නම, වයස සහ විවාහක අවිවාහක බව
2. අදාල අධ්‍යාපන සහතික සහ උප්පැන්න සහතිකය ඇතුළු වෙනත් සහතික වල සහතික කරන ලද පිටපත් ඇමිණීම අනිවාර්යය වේ.
3. වර්තමාන සහ පසුගිය රැකියාවන් හි රැකියා යෝජකයන්ගේ නම, ලිපිනය සහ රැකියාව වෙනස් කිරිමට හේතු
4. අයදුම්කරුගේ කුසලතාවයන් සහ දැනුම ඇගයීමට හැකි ඥාතීන් නොවන නිර්දේශකවරුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්

ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරිමට හේතු වේ. කුමන ආකාරයකින් හෝ මේ සම්බන්ධයෙන් අනිසි බලපෑම් කිරීමද නුසුදුසුකමක් වනු ඇත.

අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
ඩාර්ටන්ෆීල්ඩ්
අගලවත්ත.

2024.07.24